www.agaram.lk

NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 10 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | 6 ඒකකය |
|---|---|---|

## සසුන් කෙත සරු කළ, උතුමෝ ගුණැති පෙර කල

01. නිවැරදි පිළිතුර ලකුණු කරන්න.

1. අසරණ සරණ සිරි සරණංකර නාහිමිගේ ගම් ප්‍රදේශය වන්නේ,
   - i. වැලිවිට ග්‍රාමයයි
   - ii. වැලිවිටිය ග්‍රාමයයි
   - iii. වැලිඔය ග්‍රාමයයි
   - iv. වැලිමඩ ග්‍රාමයයි

2. අසරණ සරණ වැලිවිට සරණංකර නාහිමි උපත ලැබූ වර්ෂය නිවැරදි වර්ණය වන්නේ,
   - i. 1668 වර්ෂයේය
   - ii. 1658 වර්ෂයේය
   - iii. 1698 වර්ෂයේය
   - iv. 1648 වර්ෂයේය

3. සරණංකර නාහිමි ගේ ගිහි නම වනුයේ,
   - i. කුලතුංග බණ්ඩාර ය
   - ii. බණ්ඩාර මුදියන්සේ ය
   - iii. මුදියන්සේ දිසානායක ය
   - iv. බණ්ඩාර වීරතුංග ව

4. සියම් දේශයෙන් උපසම්පදාව රැගෙන මෙරට වැඩම කළ ප්‍රධාන තෙරුන් වහන්සේ,
   - i. මිහිඳු මහ තෙරුන්ය
   - ii. සුමන සාමණේරයන්ය
   - iii. අරිට්ඨ තෙරුන්ය
   - iv. උපාලි තෙරුන්ය

5. ශ්‍රී ලංකාවේ සම්බුද්ධ ශාසනය පිරිහී එකදු උපසම්පදා භික්ෂුවක් නොමැති වූ යුගය වනුයේ,
   - i. පොළොන්නරු යුගයයි
   - ii. අනුරපුර යුගයයි
   - iii. දඹදෙණි යුගයයි
   - iv. මහනුවර යුගයයි

6. "සිල්වත් සමාගම" ආරම්භ කරනු ලැබූයේ,
   - i. ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාය
   - ii. අනඳ මෛත්‍රී තෙරුන්ය
   - iii. සිරි සරණංකර තෙරුන්ය
   - iv. ශ්‍රී සුමංගල තෙරුන්ය

7. දුටුගැමුණු මහ රජතුමා ඉදි නොකළ වෙහෙර වහන්සේ නමක් වනුයේ,
   - i. රුවන්වැලි මහ සෑය
   - ii. මිරිසවැටි මහ සෑය
   - iii. අභයගිරි මහ සෑය
   - iv. ලෝවාමහා ප්‍රාසාදය

8. "උඩගු නොව මහණ" යන ප්‍රකාශය භාවිත කළේ,
   - i. දුටුගැමුණු කුමරුය
   - ii. සද්ධාතිස්ස කුමරුය
   - iii. රේරුකානේ චන්දවිමල නාහිමිය
   - iv. අසරණ සරණ සිරි සරණංකර හිමිය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

9. ත්‍රිසිංහලය ලෙස හඳුන්වන්නේ,

   i. උඩරට, පහතරට, මතුරට
   ii. රුහුණු, පිහිටි, මායා
   iii. ගම්, නියම්ගම්, රාජධානි
   iv. සීතාවක, රයිගම, කෝට්ටේ

10. දුටුගැමුණු කුමරු එළාර සමග කළ අන්තිම ද්වන්ද සටන සිදු වූ ස්ථානය වනුයේ,

   i. වෙල්ලස්සය
   ii. විජිතපුරය
   iii. අනුරාධපුරය
   iv. ගජබාපුරය

11. සිරි සරණංකර නාහිමි රචිත ධර්ම ග්‍රන්ථයක් නොවන්නේ,

   i. සාරාර්ථ සංග්‍රහය
   ii. මුනිගුණ අලංකාරය
   iii. සඟ සරණාය
   iv. සතර බණවර සන්නය

02. I. අසරණ සරණ සිරි සරණංකර නාහිමි පැවිදි වූ විහාරස්ථානය නම් කරන්න.
   II. සරණංකර නාහිමිගෙන් සිදුවූ සේවාවන් දෙකක් සඳහන් කරන්න.
   III. සම්බුද්ධ ශාසනය පිරිහී ඇති අවධියක අපගේ වගකීම කෙබඳුදැයි පැහැදිලි කරන්න.

03. I. දුටුගැමුණු රජු කොපමණ කලක් රට පාලනය කළේදැයි සඳහන් කරන්න.
   II. දුටුගැමුණු රජුගේ අභීත සටන් පාඨය සඳහන් කරන්න.
   III. කිනම් අභියෝග පැමිණියද නිවැරදි දේ කිරීමට දුටුගැමුණු මහරජ චරිතයෙන් ලබාදෙන මඟ පෙන්වීම පිළිබඳ පැහැදිලි කරන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk